# කෝට්ටේ යුගයේ රාජත්වය

ජේ. ඇම්. සුධර්මාවතී
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## සංක්ෂේපය

ඓතිහාසික මූලාශ්‍රය අනුව ක්‍රි.පූ. 6 වන සියවසේ දී ආර්ය ජනාවාස බිහිකර ගත් පිරිස් තම නායකයා, පාලකයා ලෙස අභිෂේක කිරීම හේතු කොට ගෙන මෙරට පළමුවන රජු ලෙස විජය සැලකේ. විජය රජුගේ පටන් ලංකාවේ රාජත්වය සම්බන්ධ වරින්වර එකතු වූ චාරිත්‍ර කාලයත් සමඟ සම්ප්‍රදායන් බවට පත් විය.

අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන ආරම්භ වූ මෙරට අගනගරය විවිධ හේතු නිසා වෙනත් ස්ථාන කරා කලයෙන් කාලයට මාරු විය. එම ගමන් මගෙහි එක් ස්ථානයක් කෝට්ටේ මුල් කරගෙන බිහිවිය. ක්‍රි. ව. 15 වන සියවසේ මුල් භාගයේ දී කෝට්ටේ අගනුවර ලෙසට වර්ධනය විය. ක්‍රි.ව. 1415 දී හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් බලකොටුවක් ලෙස පැවතුන කෝට්ටේ අවශ්‍ය අංගෝපාංග ඇතුළත් කරමින් අගනගරයක් බවට පත්කර ගන්නා ලදී. ක්‍රි. ව. 1415 සිට ක්‍රි. ව. 1597 දක්වා සියවස් එකහමාරකට අධික කාලයක් පැවති මෙම රාජධානියේ රජ වූ පාලකයන් රාජත්වය පිළිබඳව වූ සම්මත චාරිත්‍රයන්ට අනුකූලව පාලනය ගෙන ගියාදැයි පරීක්ෂාවට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වී ඇත.

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. රාජත්වය සම්බන්ධව කාලයක් තිස්සේ පවත්වාගෙන ආ සම්ප්‍රදායන් රැසකි. එම සම්ප්‍රදායන්ගේ මූලික ම කාරණය වූයේ රජකම පිළිබඳ හිමිකම හෙවත් උරුමය යි. එමෙන් ම ක්ෂත්‍රිය වංශිකයකු වීම, අභිෂේකය පැවැත්වීම, යුවරජු පත්කර ගැනීම හා ඔහුගේ උරුමය යන කාරණා වැදගත් කොන්දේසි විය. එමෙන් ම රාජත්වය හා බෞද්ධාගම අතර අන්‍යෝන්‍ය බැඳීම ද ප්‍රධාන ලක්ෂණයක් විය.

කෝට්ටේ අවධියේ සිහසුන දැරූ පාලකයෝ අතර මෙකී සම්ප්‍රදායන් අනුගමනය කළ මෙන් ම එයින් බැහැර වූ පිරිස් ද වූහ. එවැනි තත්ත්වයන් ඇතිවීමෙහි ලා කවර හේතු සාධක බලපාන ලද්දේ දැයි මෙම පර්යේෂණය තුළින් ඉස්මතු කර ගැනීමට හැකියාව ලැබිණි.

**ප්‍රමුඛ පදඃ** කෝට්ටේ, රාජත්වය

# *Kingship during the Kotte Period of the history of Sri Lanka*

J.M. Sudharmawathi
Department of History, University of Kelaniya, Sri Lanka

## *Abstract*

According to historical sources the Aryans who started settlements in $6^{th}$ century B.C., accepted their leader as the ruler of the kingdom. Thus Vijaya is regarded as the first king of Sri Lanka. The customs which originated from the time of King Vijaya established themselves as traditions.

The capital which was situated in Anuradhapura shifted to various places of the country from time to time. Kotte was one such place. Kotte developed as the capital during the first half of the 15th Century A.C. King Parakkramabahu VI developed Kotte, which was only a fortress at the beginning, into a full fledged capital city in 1415 A.C. The objective of this paper is to examine whether the kings of Kotte from 1415 A.C. to 1597 A.C. ruled according to the established norms on kingship.

There is a large amount of tradition regarding kingship in Sri Lanka. Among them, traditions on inheritance to the throne as the main one. Moreover, conditions such is belonging to the Kshatriya clan for enthronement, the position of Yuvaraja, and his right to the throne were important. The mutual bond between kingship and Buddhism was also a major characteristic.

It was revealed that while some rulers of Kotte acted according to these traditions some tended to overlook them. This study examines many factors, which were considered alternatives to tradition.

***Keywords:*** Kotte, Kingship

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මෙරට අගනුවර වශයෙන් පැවති කාලවකවානුව කෙටි එකක් වුව ද එය ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. ඒ, මෙරට සභ්‍යත්වයේ මින් පෙර නොවූ විරූ ආකාරයේ වර්ධනීය තත්ත්වයක් තත් රාජධානියේ ආරම්භක වර්ෂ පණහක පමණ කලක් තුළ දක්ෂ පාලකයෙකු යටතේ පැවති අතර තදනන්තරව ඇති වූ අභ්‍යන්තර දේශපාලන ගැටුම් හා තීරණාත්මක විදේශීය බලපෑම් නිසා එම වර්ධනයේ සීඝ්‍ර පරිහානියක් හා බිඳ වැටීමක් ද මේ අවධිය සනිටුහන් කරන බැවිනි.

කෝට්ටේ අවධියේ පැවති රාජත්වය සම්බන්ධව පරීක්ෂා කිරීමේදී කෝට්ටේ අගනුවර බවට පත් කරගැනීමෙහිලා හේතු වූ සාධක බෙහෙවින් ම වැදගත් වේ. ගම්පොළ යුගයේ පැවැති දේශපාලන පසුබිම බෙහෙවින් ම එයට බලපෑවේ ය. සමකාලීන රජුන් කිහිපදෙනෙකු විසින් රාජ්‍ය කොටස්වලට බෙදා පාලනය කිරීම, රජ පවුලේ ගැටුම් ඇති වීම, දුර්වල රජුන් සිටීම, රජුට වඩා ප්‍රභූන් බලවත්වීම, ප්‍රභූ පවුල් අතර ගැටුම්, යාපන අර්ධද්වීපයෙහි ස්වකීය ආධිපත්‍යය තහවුරු කරගත් ආර්යචක්‍රවර්තීන් දකුණේ පිහිටි විශාල රාජ්‍යයට බලපෑම් එල්ල කිරීම, චීනය හා ලංකාව අතර වූ දේශපාලන සම්බන්ධතා සක්‍රීය වීම හා බටහිර හා නිරිත දිග වෙරළ තීරයේ ආර්ථික හා දේශපාලන ක්‍රියාකාරකම්වල වර්ධනයක් ඇති වීම ද එකල දක්නට ලැබුණි[4].

ආර්යචක්‍රවර්තීහු දේශපාලන ආධිපත්‍යයෙන් හා ආර්ථික අතින් ද ශක්තිමත් වීම සඳහා දකුණු දිග රාජ්‍යයට විවිධ බලපෑම් ඇති කිරීමට තරම් ප්‍රබල තත්ත්වයකින් යුක්ත වූහ[5]. මේ තත්ත්වය තුළ පළමුවෙන් ම ජයවර්ධනපුර කෝට්ටේ නමින් බලකොටුවක් ඉදිකරන ලද්දේ ආරක්ෂාව පදනම් කරගෙන ය. බලකොටුව ඉදිකෙරුණේ තුන්වන වික්‍රමබාහු රජ දවස රයිගම විසූ අලගක්කෝනාර හෙවත් නිශ්ශංක අලකේශ්වර නම් ප්‍රභූරාජයා ගත් පියවරක ප්‍රතිඵලයක් ලෙසිනි.

බලකොටුව ඉදිකිරීම පිළිබඳ සමකාලීනව හා පසුකාලීනව රචිත මූලාශ්‍රය තොරතුරු අනුව අලකේශ්වරයන් ආර්යචක්‍රවර්තීන්ට පහරදීමට ප්‍රථම දීර්ඝ කාලීන පූර්ව සූදානමක් ඇති කරගෙන තිබේ[6]. එම තොරතුරුවලින් අලකේශ්වරයන් බලකොටුව ඉදිකිරීමට ක්‍රියාකළ ආකාරය සම්බන්ධව පැහැදිලි විග්‍රහයක් ඉදිරිපත් කෙරේ. බලකොටුව තුළ සිටිමින් ආර්යචක්‍රවර්ති සේනා සමඟ යුද්ධ කොට ඔවුන් පලවා හරිමින් අලගක්කෝනාර රණබිමේ දී ලැබූ විශිෂ්ට ජයග්‍රහණය පිළිබඳ එන විස්තර මගින් බලකොටුවක් ලෙස මුලින් ම කෝට්ටේ ගොඩනගා ගැනීමේ සාර්ථකත්වය පැහැදිලි වේ[7].

වංශකථා තොරතුරු අනුව මෙරට පාලන නායකත්වයක් පළමුවරට ඇති වන්නේ විජය කුමරු ඇතුලු පිරිස මෙරටට පැමිණ ජනාවාස පිහිටුවාගෙන විජය කුමරු අභිෂේක ලැබීමත් සමඟ ය[8]. ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයේ ප්‍රබල පාලකයා වූ අශෝක අධිරාජයාගේ

---

4 Herath, 2004, 16; Herath, 1994, 74, 76; පරනවිතාන, 1972, 610-612.

5 *නිකාය සංග්‍රහය*, 1934, 29-30; *අලකේශ්වර යුද්ධය*, 1965, 19- 20; *සද්ධර්මරත්නාකරය*, 1955, 317-318; *රාජාවලිය*, 1997, 216.

6 *නිකාය සංග්‍රහය*, 1934, 29; *සද්ධර්මරත්නාකරය*, 1955, 317; *රාජාවලිය*, 1997, 216

7 *රාජාවලිය* 1997, 216; *නිකාය සංග්‍රහය*, 1934, 30; *අලකේශ්වර යුද්ධය*, 1965, 19-20

8 ම.ව. 7 පරි. 48

හා මෙරට පාලක දේවානම්පියතිස්ස රජතුමා අතර වූ මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස එරට සම්ප්‍රදාය අනුව අංග සම්පූර්ණ අභිෂේක ක්‍රමයක් මෙරටට හඳුන්වා දීම රාජත්වයේ වර්ධනීය කඩඉමක් ලෙස ගත හැකි ය[9]. එමෙන් ම අශෝක අධිරාජයාගේ මැදිහත්වීමෙන් මෙරට මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූත පිරිස බුදු දහම රැගෙන පැමිණීම හා දේවානම්පියතිස්ස රජු ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස කටයුතු කිරීම ද මෙරට රාජත්වය සම්බන්ධ තවත් සන්ධිස්ථානයකි[10].

මෙරට රාජත්වය හැඩගැසී ම කෙරෙහි රාජාභිෂේකය හා බුදු දහමේ ආභාසය යන අංශ දෙකම ප්‍රබල සාධක බවට පත් විය. මෙලෙස අනුරාධපුර අවධියේ මුල සිටම රාජත්වය පිළිබඳ චාරිත්‍ර සකස් වෙමින් ඒවා සම්ප්‍රදායන් බවට පත් වී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ගොඩනංවා දිවයිනේ දකුණු දිගට හා මධ්‍යම කඳුකරයට පැතිරෙමින් තිබූ යාපනේ ආර්යචක්‍රවර්තින්ගේ බලය මැඩපැවැත්වීම අනාගතයේ බිහිවිය හැකිව තිබූ ඒකච්ඡත්‍ර ශ්‍රී ලංකාවට මඟ හෙළිකර දුන්නේ ය[11]. කෝට්ටේ රාජ්‍යයේ සිහසුන දැරූ පාලකයන් වූයේ හයවන පරාක්‍රමබාහු (1415-1467), දෙවන ජයබාහු (1467-1469)[12], හයවන බුවනෙකබාහු (1470-1478), හත්වන පරාක්‍රමබාහු (1478-1484), අටවන වීර පරාක්‍රමබාහු (1484-1508/1509), නවවන ධර්ම පරාක්‍රමබාහු (1509-1519), හයවන විජයබාහු (1519-1521), හත්වන බුවනෙකබාහු (1521-1550) හා දොන් ජුවන් ධර්මපාල (1551-1597) යන රජවරුන් ය.

පහළොස් වන සියවසේ මුල් භාගයේ සිට සියවස් දෙකකට කිට්ටු දීර්ඝ කාලයක් පුරා පැවැති කෝට්ටේ සමයේදී ලංකාවේ අභිෂේක ලැබූ රජුන් වශයෙන් නීත්‍යානුකූලව පිළිගැනුනේ කෝට්ටේ පාලකයන් පමණි. පූර්ව රාජ්‍ය සමයන්හිදී මෙන් කෝට්ටේ රාජ්‍යයේ ද ශ්‍රේෂ්ඨතම නායකයා වූයේ රජතුමා ය. හයවන පරාක්‍රමබාහු කෝට්ටේ අගනුවර ලෙස තෝරාගනිමින් දිවයිනේ අගරජ බවට පත්වීම මෙරට දේශපාලන ඉතිහාසයෙහි පමණක් නොව සෑම ක්ෂේත්‍රයක ම දීප්තිමත් කාලවකවානුවක් සනිටුහන් කළේය. මොහු සිහසුනට පත්වන විට මෙරට දේශපාලන තන්ත්‍රය තුළ වියවුල් සහිත තත්ත්වයක් පැවැතුණි[13]. රජෙකුගේ ප්‍රධාන වගකීම වූයේ ලෝක ශාසන දෙක (රටවැසියා සහ ආගම) ආරක්ෂා කිරීමයි. ඒ අනුව පරසතුරන්ගෙන් රාජ්‍යය රැකගැනීම, ආගම දියුණු කිරීම සහ සමාජයේ සමඟියත් සාමයත් ඇති කිරීමට කටයුතු කිරීම රජුගේ වගකීම විය[14]

කෝට්ටේ පළමු පාලකයා වූ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ පරපුර, රාජ්‍ය උරුමය, සිංහාසන පදවිප්‍රාප්ත වූ අයුරු හා රජ පැමිණි වර්ෂය පිළිබඳව පවත්නා තොරතුරු අනුව

---

9 ම.ව. 11 පරි. 28 - 36

10 ම.ව. 14 පරි. - 19 පරි.

11 ඉලංගසිංහ, 2005, 23

12 මූලාශ්‍රය මේ රජු විවිධ නම්වලින් හඳුන්වා ඇත. නිදසුන් වශයෙන් *මහාවංසය* 'ජයබා' නමින් ද (92 පරි. 1 ගාථාව), *රාජාවලියේ* 'වීරපරාක්‍රමබාහු' හා 'ජයවීර පරාක්‍රමබාහු' යන නම්වලින් ද (1997: 219), *අලකේශ්වර යුද්ධය* 'ජයවීර පරාක්‍රමබාහු' නමින් ද (1965, 24), *රාජරත්නාකරය* 'ජයබාහු' නමින් ද (1995, 121) හඳුන්වා ඇත. මේ පිළිබඳව සෝමරත්න (1975, 133) දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඇත.

13 පරනවිතාන, 1972, 624-635

14 පෙරේරා, එල්. එස්., 1987, 142; *කෝකිල සන්දේශය*, 08 කවිය.

නිශ්චිත නිගමනයකට එළඹීමට අසීරුය.[15]. කෙසේ වුව ද, මුල් අවධියේ පටන් ම සෑම සිංහල රජකෙනෙක්ම ක්ෂත්‍රීය වංශිකයන් වූ බව දක්නට ඇත[16]. මෙකල ලියවුණු කාව්‍ය ග්‍රන්ථ අනුව හයවන පරාක්‍රමබාහු රජතුමා මෙරට සිහසුන දැරූ පැරණි ක්ෂත්‍රීය රාජ පරම්පරා කුල ගෝත්‍රයන්ට අයත් වේ. *පැරකුම්බා සිරිත* හා *කාව්‍යශේඛරය* ඇතුළු තවත් මූලාශ්‍රය අනුව රජුගේ මව කාලිංග රටේ රජ පෙළපතට අයත් සුනේත්‍රා දේවිය වන අතර පියා ක්‍රි. පූ. තුන්වන සියවසේ ශ්‍රී මහාබෝධිය වඩමවාගෙන මෙරටට පැමිණි පිරිසේ සිටි ධර්මාශෝක පරපුරට අයත් සුමිත්ත කුමරුගෙන් පැවැත එන ජයමාලේ මහිපති ය[17].

පරම්පරාව සම්බන්ධව එන තොරතුරු අනුව මේ රජු සූර්යවංශයට අයත් 'ලැමැණි' (ලම්බකර්ණ ගණවැසි) පෙළපතෙන් පැවැතෙන අතර[18] කුරුණෑගල රජ කළ සවුළු විජයබාහු හෙවත් පස්වන විජයබාහු රජුගේ පරපුරට අයත් ය[19]. ඔහු පස්වන විජයබාහු රජුගේ පුත්‍රයකු වූ ගම්පොළ රජ කළ පස්වන පරාක්‍රමබාහු රජුගේ මුනුබුරෙකු විය[20]. ලම්බකර්ණයන් ක්ෂත්‍රීයයන් නොවන බවට මතයක් පැවැතුණ ද[21] අනුරාධපුර යුගයේදී සිහසුන දැරූ ප්‍රධාන රාජවංශයක් වූයේ ලම්බකර්ණයන් ය[22]. හයවන පරාක්‍රමබාහු රජුට මෙරට සිහසුන දැරීමට තරම් ක්ෂත්‍රීය උරුමයක් තිබුණ බව මේ මූලාශ්‍රය මගින් පෙන්නුම් කිරීමට ගෙන තිබෙන උත්සාහය අනුව ඔහුට රාජ්‍යය සඳහා උරුමයක් තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය.ලක්දිව රාජ්‍ය උරුමය හිමි වූයේ පියාගෙන් පුතාට හෝ සහෝදරයාගෙන් සහෝදරයාට යන පිළිවෙළට ය[23]. හයවන පරාක්‍රමබාහු රජතුමාට සඳවතී හා උලකුඩය දේවිය නමින් දියණියන් දෙදෙනෙකු සිටිය ද රජුගේ අනුප්‍රාප්තිකයා වීමට පුත්‍රයෙකු නොසිටි නිසා පැන නැගුණු තත්ත්වය හමුවේ රජතුමාගේ දෙටු දියණියට (සඳවතීට) සුදුසු සැමියකු හා දරුවන් ලබා දෙන මෙන් උපුල්වන් දෙවියන්ගෙන්[24] ද, උලකුඩය දේවියට පුත්රුවනක් ලබා දෙන මෙන් විභීෂණ දෙවියන් ගෙන්[25] ද රජතුමාගේ පුත්‍ර ස්නේහයෙහි හැදුණු තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ[26] අයැද සිටියහ. සැමියකු ලැබීමට පෙර සඳවතී මිය ගිය[27] ද උලකුඩය දේවියට දරුවකු ලැබුණි. ඔහු ජයබාහු ය. මෙරට රාජත්වයේ උරුමය සඳහා පැවැති ඉතා වැදගත් හා සම්ප්‍රදායික පිළිවෙත් මේවායින් හෙළි වේ.

---

15 පරනවිතාන, 1972, 625-633

16 හෙට්ටිආරච්චි, 2008, 143; පරනවිතාන, 1964, 221

17 පරනවිතාන, 1972, 625- 633; *පැරකුම්බා සිරිත,* 27 කවිය; *කාව්‍යශේඛරය*, 15 සර්ගය 17-21 කවි; *සිංහල බෝධිවංශය*, 1998, 183

18 'රිවිකුල කමලකර- රිවිකුල ළමැණි ගොත් පිරිසිදු ගුවන් මැද....' *සැළලිහිණි ස.*, 19 හා 97 කවි, 'සුනිමල ළැමණි කුල තිලකෙව් උදුළ හැම කළ....' *පරෙවි ස.*, 46 කවිය, 'සරසමින් කුල දිවයුරා ...'*පැරකුම්බා සිරිත,* කවිය; *අලකේශ්වර යුද්ධය*, 1965, 21; *රාජරත්නාකරය*, 131; *ගිරා සන්දේශය*, 125, 130, 137 කවි

19 අභයසිංහ, 1997ල 15

20 *පරෙවි සන්දේශය*, 22, 27 කවි; *පැරකුම්බා සිරිත*, 27 කවිය; පරනවිතාන, 1972, 603-604; අබයරත්න, 2004, 103, 224. මෙම ග්‍රන්ථයේ දෙවැනි පරිච්ඡේදයේ මේ පිළිබඳව සවිස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

21 එල්ලාවල, 2004, 31

22 හෙට්ටිආරච්චි, 2008, 221-226

23 පරනවිතාන, 1964, 222

24 *පරෙවි සන්දේශය*, 204 කවිය

25 *සැළලිහිණි සන්දේශය*, 103 කවිය

26 ගිරා සන්දේශය, 232 කවිය

27 ඨ තෙන්නකොන්, 1957, i, ii, iv

රජු ලඟට පදවිප්‍රාප්තියට සුදුස්සා වූයේ ඔටුන්න හිමි කුමාරයා ය. එනම් උපරාජ හෙවත් යුවරජු ය. එම තනතුරට පත් වූයේ රජුගේ පුත්‍රයා හෝ බාල සහෝදරයෙකි[28]. හයවන පරාක්‍රමබාහු රජතුමාගේ යුවරජු ලෙස සිටියේ බාල සහෝදර අම්බුලුගල කුමාරයා ය. මොහු 'මායාදුනුනුවර පරාක්‍රමබාහු' නමින් ද හඳුන්වා ඇත[29]. මොහු මායාදුනු නුවර වාසය[30] කළ අතර හෙතෙම පරාක්‍රමබාහු රජුට පෙර මිය ගියේ ය. එම තනතුර සඳහා ඉන් පසුව පත් කරන ලද්දේ අම්බුලුගල කුමාරයා නම් වූ සපුමල් කුමරුගේ බාල සහෝදරයා ය[31]. සපුමල් කුමරු හයවන පරාක්‍රමබාහු රජුගේ පුතෙකු ලෙස සඳහන් අවස්ථා තිබුණ ද ඔහු කුඩා කල සිටම පුත් තනතුරේ හදා වඩාගත් පුත්‍රයෙකු[32] මිස සුජාත පුත්‍රයෙකු නොවීය. එසේ ම සපුමල් කුමරුගේ බාල සහෝදරයා වූ අම්බුලුගල කුමාරයා ද රජුගේ සෙවනේ හැදී වැඩුණි. මොවුන්ගේ පියා දකුණු ඉන්දියාවේ මලබාර් ප්‍රදේශයේ සිට පැමිණි රජ වාසලේ සේවය කළ පනිකල වේ, රාජවංශයට අයත් ක්‍රියාශීලී විචක්ෂණ පුද්ගලයෙකු ලෙස සඳහන් වේ[33]. මොහු රාජවංශයට අයත් යැයි දැක්වීමෙන් 'ක්‍ෂත්‍රිය' වංශිකයෙකු බව හැඟේ. ඒ අනුව මොවුන් ද ක්‍ෂත්‍රිය වංශිකයන් යැයි අනුමාන කළ හැකි ය. අම්බුලුගල කුමාරයාගේ පාලන ප්‍රදේශය වී තිබුණේ ද සතර කෝරලය යි[34]. එහෙත් පරාක්‍රමබාහු රජුගේ අවසාන රාජ වර්ෂය වන විට රජුගේ මුනුබුරු ජයබාහු කුමාරයා යුවරජ තනතුර දරන්නට ඇතැයි ද අදහසක් පවතී[35]. ඒ අනුව හයවන පරාක්‍රමබාහු රජතුමා මියයාමට පෙර ජයබාහු කුමාරයා රාජ්‍ය උරුමක්කරු ලෙස පත්කොට තිබුණි. මොහු තම දියණිය වූ උලකුඩය දේවියගේ පුත්‍රයා ය. ඔහුගේ පියා ලෙස සඳහන් වන්නේ දකුණු ඉන්දීය ප්‍රභවයක් ඇති දෙමළ ප්‍රභුවරයෙකු වූ නන්නූර්තුනයාර් ය[36]. හයවන පරාක්‍රමබාහුගේ ඇවෑමෙන් රජ වූ වීරපරාක්‍රමබාහු[37] නමින් ද හැඳින් වූ දෙවන ජයබාහු කුමරුට කෝට්ටේ සිහසුන දැරීමට හැකිවුයේ වසර දෙකක් පමණි. උතුරේ විසූ සපුමල් කුමාරයා වීරපරාක්‍රමබාහු[38] ජීවිතක්‍ෂයට පත් කර හයවන බුවනෙකබාහු (ශ්‍රී බුවනෙකබාහු) නමින් කෝට්ටේ රජවිය[39]. සපුමල් කුමරුගේ ක්‍රියාකලාපය පිළිබඳව ශ්‍රී රාහුල සංඝරාජයන්ගේ ද රාජ්‍ය නිලධාරීන් හා ප්‍රභූන් ඇතුළු විශාල පිරිසකගේ ද අප්‍රසාදය ඇති වී තිබුණි. සපුමල් කුමරු යාපනේ ජයග්‍රාහකයා වශයෙන් සිංහල මිනිසුන් අතර සම්මානයට පාත්‍ර වී සිටිය ද මුළු දිවයිනේ ම රජු වූ පසු ඔහුට ජනතාවගේ පක්ෂපාතීත්වය අඛණ්ඩව පවත්වා ගත නොහැකි විය. ඔහුට එරෙහිව 'සිංහල පෙරළිය', 'සිංහල සංගේ' (සිංහලයන්ගේ සටන), යන නම්වලින් හැඳින්වෙන ජනතා විරෝධයක් හෙවත් කැරැල්ලක් පැන නැගුණි. පරනවිතාන මහතා දක්වන ආකාරයට කැරැල්ල මේ නමින් හැඳින්වෙන්නට ඇත්තේ පිය පසින් මලයාළි පෙළපතකට අයත් පාලකයෙකුට එරෙහිව ජාත්‍යානුරාගී හැඟීම් නිසා පැනනැගුනක් ලෙසට ය[40]. පරනවිතාන

28 හෙට්ටිආරච්චි, 2008, 143; රණවැල්ල, 2000, 142

29 සෝමරත්න, 1982, 18

30 *පරෙවි සන්දේශය*, 203 කවිය

31 පරනවිතාන, 1972, 641; හෙට්ටිආරච්චි, 2008, 439

32 ඊ. තෙන්නකොන්, 1957, i, ii

33 පරනවිතාන, 1972, 637; *අලකේශ්වර යුද්ධය*, 1965, 22

34 රාජාවලිය, 1997, 220

35 සෝමරත්න, 1982, 18

36 *සැළලිහිණි සන්දේශය*, 96 කවිය හා 208, 209 පිටු

37 *රාජාවලිය*, 1997, 219

38 වීරපරාක්‍රමබාහු, ජයවීරපරාක්‍රමබාහු නමින් ද *රාජාවලියේ* දක්වා ඇත (*රාජාවලිය*, 1997, 219).

39 ම. ව., 92 පරි. 2; *රාජාවලිය*, 1997, 219; *අලකේශ්වර යුද්ධය*, 1965, 24

40 පරනවිතාන, 1972, 642

ශූරීන් එසේ ප්‍රකාශ කළත් පිය පාර්ශවයෙන් මොවුන් දෙදෙනාම ලාංකිකයන් ය. ජනතා විරෝධයක් නැගෙන්නට ඇත්තේ හයවන පරාක්‍රමබාහු රජතුමා හා රජ පවුල කෙරෙහි වැසියා තුළ පැවැති භක්ත්‍යාදරය නිසා විය හැකිය. ඒ අනුව රජතුමාගේ දියණියගේ පුත්‍රයා යන්න හා රජු විසින් පත්කළ පාලකයා සපුමල් කුමරු විසින් ජීවිතක්‍ෂයට පත් කිරීම යන හේතු විය හැකිය. මී කැරැල්ල මර්දනය කිරීමට යුවරජ අම්බුලුගල කුමරු සහයෝගය ලබා දුන්නේ ය[41].

තමා හයවන පරාක්‍රමබාහුගේ පුතෙකු බව ප්‍රසිද්ධ කරමින් ඔටුන්නට තමා නියම උරුමක්කරු බව දැක්වීමට හයවන බුවනෙකබාහු හෙවත් සපුමල් කුමරු යත්න දැරීය[42]. දැදිගම සෙල්ලිපියේ දැක්වෙන 'ශ්‍රී පරාක්‍රමබාහු මහා රාජාධිරාජනන්දන ……' යන සටහනින් ද ඒ බව තහවුරු වේ[43]. මෙහි 'නන්දන' ලෙස හැඳින්වෙන්නේ පුතා ය. හයවන බුවනෙකබාහු මෙලෙස සිය රාජ්‍ය බලය තහවුරු කරගැනීමට ඉමහත් ප්‍රයත්න දරා තිබේ[44]. ඔහුගේ ඇවෑමෙන් රජකමට තෝරා පත් කර ගන්නා ලද්දේ යුවරජු නොව රජුගේ පුත් පරාක්‍රමබාහු ය[45]. මේ අනුව ඔහු ද පූර්ව චාරිත්‍ර නොසලකා කටයුතු කර ඇත. ඇතැම් මූලාශ්‍රය දක්වන්නේ ඔහු හයවන බුවනෙකබාහු රජු විසින් හදාගත් පුත්‍රයෙක් වශයෙනි[46]. ඔහු රාජත්වයට පත් වූයේ හත්වන පරාක්‍රමබාහු නමිනි[47]. එහෙත් සිහසුන බලාපොරොත්තුවෙන් සිටි යුවරජ වූ අම්බුලුගල කුමාරයා හත්වන පරාක්‍රමබාහුට එරෙහිව සටන් කොට ජීවිතක්ෂයට පත් කර අටවන වීර පරාක්‍රමබාහු නමින් රජ විය[48]. මොහු වසර විස්සක් පමණ රජ කිරීමෙන් අනතුරුව මිය ගොස් ඇත. මේ රජුගේ වැඩිමහල් පුත්‍රයා වූ ධර්මපරාක්‍රමබාහු කුමාරයා යුවරජු ලෙස පත් කර ගන්නා ලදී. ඔහු පිය රජු දවස රජු වෙනුවෙන් පාලන කටයුතු මෙහෙයවූ බවට ද මතයක් පවතී. සිය පියරජු ඇවෑමෙන් ධර්මපරාක්‍රමබාහු කුමාරයා නවවැනි ධර්මපරාක්‍රමබාහු නමින් රජ බවට පත් විය[49]. ඔහුගේ අනෙක් සහෝදරවරු රාජ්‍යයේ විවිධ ප්‍රදේශවල පාලන මධ්‍යස්ථාන පිහිටුවාගෙන රජුගේ පාලනය යටතේ සිටිමින් ඒ ඒ ප්‍රදේශ පාලනය කළහ. ඒ අනුව සකලකලාවල්ලභ කුමරු උඩුගම්පොළ ද රාජසිංහ කුමරු මැණික්කඩවර ද තනියවල්ලභ කුමරු මාදම්පේ ද විජයබාහු හෙවත් චක්‍රායුධ කුමරු රයිගම ද වශයෙන් ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත්හ[50]. වීර පරාක්‍රමබාහු රජුගේ වැඩිමහල් පුත්‍රයා යුවරජු වශයෙන් පත් කිරීමත් පියරජුගේ ඇවෑමෙන් ඔහු සිහසුනට පත්වීමත් චාරිත්‍රානුකූලව රාජ්‍යත්වය පිළිබඳව නිවැරැදි තීරණයට එළඹි අවස්ථාවකි[51].

---

41 *රාජාවලිය*, 1997, 219-220

42 සෝමරත්න, 1982, 19; Somaratne, 1975, 141)

43 *E. Z.,* vol. iii: 279

44 බස්නායක, 2002ල 36

45 සෝමරත්න, 1982, 21; *රාජාවලිය*, 1997, 220

46 *රාජාවලිය*, 1997, 220

47 *රාජාවලියේ* (1972, 220) ඔහු හඳුන්වා ඇත්තේ 'පණ්ඩිත පරාක්‍රමබාහු' වශයෙනි.

48 *රාජාවලිය*, 1997, 220

49 *රාජාවලිය*, 1997, 221

50 සකලකලාවල්ලභ කුමරු පාලනය කළ උඩුගම්පොල කෝරල හතකින් ද රාජසිංහ කුමරු පාලනය කළ මැණිකකඩවර කෝරල හතරකින්ද තනියවල්ලභ කුමරු පාලනය කළ මාදම්පේ කෝරල දෙකකින්ද සමන්විතවිය(Silva, CR, 1995: 13).

51 මේ සම්බන්ධව දෙවැනි පරිච්ඡේදයේ සවිස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

පවුලේ කුමාරවරු යටතේ රාජ්‍යය කොටස්වලට බෙදා පාලනය කිරීම මෙරට දේශපාලන තන්ත්‍රයේ නව ලක්‍ෂණයක් නොවීය. මේ තත්ත්වය කෝට්ටේ ස්වාධිපත්‍යයට බාධකයක් නොවූයේ ඔවුන් තුළ පැවැති එක්සත්කම නිසා ය. කෝට්ටේ රාජ්‍යයට එල්ල වූ අභියෝග ජයග්‍රහණය කළ හැකි වූයේ මේ සහෝදර සමගිය හේතුවෙනි[52]. නවවන ධර්ම පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව යුවරජු වූ සකලකලාවල්ලභ කුමරු හට රජකම නිත්‍යානුකූලව උරුමව තිබුණ ද ඔහු සිය සොයුරු විජයබාහුට සිංහාසනය පැවැරීය. රාජ්‍ය උරුමයට සහෝදරයන් අතර ගැටුම් ඇති කර නොගැනීමට සකලකලාවල්ලභ කුමරු විසින් අනුගමනය කළ මේ ක්‍රියාමාර්ගය කෝට්ටේ දේශපාලන තත්ත්වය තුළ ඉතා වැදගත් සිදුවීමකි. ඒ අනුව නවවන ධර්ම පරාක්‍රමබාහු රජුගෙන් පසුව කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූයේ හයවන විජයබාහු ය[53].

හයවන විජයබාහු රජු සිය අනුප්‍රාප්තිකයා පත් කිරීම සඳහා නීත්‍යානුකූල උරුමයෙන් බැහැරව ගෙන ගිය කුමන්ත්‍රණයක් හේතුවෙන් කෝට්ටේ රාජ්‍යයේ අවුල් සහගත පසුබිමක් මෙන්ම රාජත්වය සම්බන්ධයෙන් ලාංකීය ඉතිහාසයේ කළු පැල්ලමක් ද ඇති විය. සකලකලාවල්ලභ කුමරු මියයාම නිසා හිස් වූ යුවරජ තනතුරට විජයබාහු රජු සිය දෙවන බිසවගේ පුත් දේවරාජ කුමාරයා පත් කිරීමට සැළසුම් කළේ ය. මේ රහස් කුමන්ත්‍රණය දැනගත් අගබිසවගේ පුතුන් තිදෙනා වූ බුවනෙකබාහු, පරරාජසිංහ, මායාදුන්නේ හා එක්ව ඊට එරෙහි ව ගෙනගිය විරෝධතාව මගින් පිය රජු ඝාතනය කර කෝට්ටේ රාජ්‍යය බෙදා ගත්හ[54]. ක්‍රි. ව. 1521 දී සිදු වූ මෙය 'විජයබා කොල්ලය' නමින් ප්‍රකට ය.

මේ සිද්ධියෙන් පසුව කෝට්ටේ අගරජු ලෙස අභිෂේක ලැබුවේ හත්වන බුවනෙකබාහු කුමාරයා ය. පරරාජසිංහ කුමරු රයිගම ද මායාදුන්නේ සීතාවක ද සිටිමින් ඒ ප්‍රදේශ පාලනය කළ හ[55]. හත්වන බුවනෙකබාහු රජ දවස රාජත්වය සම්බන්ධව අභ්‍යන්තරිකව මෙන් ම විදේශීය වශයෙන් ද ඇති වූ බලපෑම් හේතුවෙන් පෙර නොවූ ආකාරයේ වෙනස්වීම්වලට භාජනය වෙමින් රාජත්වය සම්බන්ධව මෙතෙක් තිබූ පෙර සිරිත් කඩවීම් සිදු විය. හත්වන බුවනෙකබාහුගෙන් පසුව කෝට්ටේ සිංහාසනයට අවසාන උරුමක්කරු ලෙස පත් කළේ ඔහුගේ මුනුබුරු වූ ධර්මපාල කුමාරයා ය. ඔහු රජුගේ දියණිය වූ සමුද්‍ර දේවියගේ පුත්‍රයා ය. ඇයගේ ස්වාමියා වූයේ හයවන විජයබාහු රජතුමාගේ සහෝදර තනීයවල්ලභ කුමාරයාගේ දියණියගේ පුත්‍රයා වූ වීදියබණ්ඩාර ය. බුවනෙකබාහු හා මායාදුන්නේ අතර දිගු කලක් තිස්සේ අරගල පැවැතීම නිසා බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගේ සහය ලබා ගැනීමෙන් සිදු වූයේ කෝට්ටේ සිහසුන ආරක්ෂා කිරීමේ කාර්යය ද පෘතුගීසීන්ට බාර වීම ය. අනාගත රාජ්‍යය හිමි කුමාරයා වූ ධර්මපාල කුමාරයාගේ පිළිරුවක් පෘතුගාලයේ ලිස්බන් නුවරට යවා එයට ඔටුනු පැළැඳවීමට හත්වන බුවනෙකබාහු කටයුතු යෙදීය. එහිදී අධිරාජයා විසින් ධර්මපාල කුමාරයා කෝට්ටේ රාජ්‍යයෙහි නීත්‍යානුකූල උරුමක්කරු බව ප්‍රකාශ කරමින් ආඥාවක් ද නිකුත් කළේ ය[56].

52 *රාජාවලිය,* 1997, 221

53 *රාජාවලිය,* 1997, 224

54 *රාජාවලිය,* 1997, 225 -227

55 *රාජාවලිය,* 1997, 227

56 *රාජාවලිය,* 1997, 227

රජකම සම්මත කරගැනීමේ චාරිත්‍රයන්ගේ ප්‍රධාන අංගයක් වූයේ අභිෂේක මංගල්‍යය පැවැත්වීමයි. *මහාවංශයේ* විජය රජුගේ අභිෂේක මංගල්‍යය පිළිබඳව සඳහන් වේ[57]. එමෙන්ම දේවානම්පියතිස්ස රජු අභිෂේක මංගල්‍යය දෙකක් පැවැත්වීය. එයින් මෞර්ය අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු කළ දෙවන අභිෂේකය මෙරට දේශපාලන ඉතිහාසයේ විශේෂිත අවස්ථාවක් බව *මහාවංශයේ* පෙන්නුම් කෙරේ[58]. අභිෂේක මංගල්‍යයට රාජත්වයේ වැදගත් සන්ධිස්ථානයක් හිමි වූයේ එය ප්‍රාදේශීය යුද්ධාධිපතියකුගේ තත්ත්වයේ පටන් සකලාංග යන්ගෙන් සමන්විත පිරිපුන් රජකුගේ තත්ත්වය දක්වා විකාශනය වීමේ අවස්ථාවවීමයි[59]. හයවැනි පරාක්‍රමබාහු රජතුමා රයිගමදී අභිෂේක ලැබූ බව මූලාශ්‍ර තුළින් හෙළි වන අතරම කීරවැල්ලේ රාජවංශික කුමරිය විවාහ කරගනිමින් ජයවර්ධනපුරයේදී නැවත අභිෂේකය ලබා ඇත.[60] හයවැනි බුවනෙකබාහු රජුගේ පටන් හත්වැනි බුවනෙකබාහු රජතුමා ඇතුළු සියලුම රජවරු චාරිත්‍රානුකූලව අභිෂේක පවත්වා ඇත[61]. *ක්‍රි. ව. 1521* විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ අගරජු ලෙස බුවනෙකබාහු රජු අභිෂේක කරනු ලැබීය. අභිෂේක මංගල්‍යය ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. එය එකල චාරිත්‍රයක් ලෙස පැවැතුන නිසා ඇතැම් පාලකයන්ගේ රාජ්‍ය වර්ෂ අනුව ඔවුහු ද මෙසේ මෞලි මංගල්‍යය පවත්වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. සෝජාත සිටු (ජෝතිය සිටුවරයා) උඩරට කැරැල්ල සිදු කරන විට රජතුමා ඔටුනු පැළඳ පනස් දෙකක් අවුරුදු"යැයි *රාජාවලියේ* සඳහන් වේ[62].

ක්‍රි. පූ. තුන්වන සියවසේ මෙරටට බුදු දහම ලැබීමත් සමඟ රාජ්‍යය හා ආගම අතර අවිච්ඡින්න සම්බන්ධතාවක් වර්ධනය වනු දැකිය හැකි ය. සඳහන් වන පරිදි රජුට පැවරුණු ප්‍රධාන කාර්යය වූයේ ලෝසසුන් වැඩීම හෙවත් මහජනයා හා බුද්ධාගම ආරක්ෂා කිරීම ය. ඒ තත්ත්වය තුළ 'රටේ පාලකයා බෞද්ධයකු විය යුතුය' යන්න සම්මත චාරිත්‍රයක් බවට පත් විය[63]. කෝට්ටේ රජවරු බෞද්ධාගමික සම්ප්‍රදායන්ට ගෞරව කරමින් ඒවා ආරක්ෂා කරගනිමින් පාලනය ගෙන ගිය හ. හයවන පරාක්‍රමබාහු රජතුමා බෞද්ධාග මික අභිවෘද්ධිය උදෙසා සිදු කළ සේවා රැසකි. මේවා අතර ශාසන සංශෝධනය කරමින් කතිකාවතක් පිහිටුවීම භික්ෂු ශාසනයේ චිරස්ථිතියට බෙහෙවින් හේතු වූ වැදගත් සේවාවක් විය[64]. කෝට්ටේ රජමහා විහාරස්ථානය, සුනේත්‍රා දේවී පිරිවෙන ඇතුළු තවත් බොහෝ වෙහෙර විහාරස්ථාන ඉදිකරමින් හා ප්‍රතිසංස්කරණය කරමින් ද ඒවායේ නඩත්තු කටයුතු සඳහා ඉඩම්, කුඹුරු ඇතුළු විවිධ පූජාවන් සිදුකරමින් ද සිදු කළ මෙහෙය අතිමහත් ය (සූරවීර, 1985: 26-27; බෙල්, 2004: 180-181). එ මෙන් ම වර්ෂයක් පාසා තුන් රට භික්ෂූන්ට කඨින චීවර දානදීම, තුන් සිවුරු පූජා කිරීම ඇතුළු අනෙකුත් ප්‍රත්‍ය පහසුකම් සපයාදීම, වටිනා ධර්ම පුස්තක ලියවීම, උපසම්පදා මංගල්‍ය පැවැත්වීම ආදී බොහෝ ශාසනික සේවා සිදු කළේ ය[65]. තව ද, මෙරට ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානය ලෙස බුරුමය, සියම, කාම්බෝජය යනාදී අග්නිදිග ආසියාතික රටවල ප්‍රකට වී ආගමික සම්බන්ධතා

57 *ම.ව.*, 7 පරි., 48-58

58 *ම.ව.*, 11 පරි. 28-36

59 හෙට්ටිආරච්චි, 2008, 20-21

60 රාජාවලිය, 1997ල 218ත පරනවිතාන, 1972ල 689

61 *රාජාවලිය*, 1997, 220-227

62 *රාජාවලිය*, 1997, 219

63 රාහුල හිමි, 65; ඉලංගසිංහ, 2005, 15; ගුණවර්ධන, 1993, 174-180

64 සූරවීර, 1985, 125-126

65 *ම. ව.*, 91 පරි. 22-35; *සද්ධර්මරත්නාකරය*, 1955, 319

ගොඩනැගීම සඳහා මේ රජුගේ ආගමික කටයුතු බලපෑවේ ය[66]. හයවන බුවනෙකබාහු රජ දවස ද බුරුමයේ සිට භික්ෂූන් පිරිසක් පැමිණ උපසම්පදාව රාජ්‍ය අනුග්‍රහය යටතේ ලබා ගත්තේය[67]. හයවැනි බුවනෙකබාහුගේ සිට හත්වැනි බුවනෙකබාහු දක්වා සියළුම රජවරු ආගමික කටයුතු ඉටුකළ බව *මහාවංශයේ* දැක්වෙන්නේ ‘මේ රජදරුවෝ තුමූත් සර්ධානුගුණ ශක්ති වූ පරිද්දෙන් ලෝක ශාසනාභි වෘද්ධිය කොට නම් වූ පරිද්දෙන් පරලොව ගිය හ’ යනුවෙනි[68]. මේ පාලකයෝ විහාරස්ථාන සඳහා ඉඩම් පූජාවන් සිදු කර තිබෙන බව අරංකැලේ සන්නස, කෑරගල පුවරු ලිපිය, කැලණි විහාර පුවරු ලිපිය, කප්පාගොඩ ටැම් ලිපිය, පල්කුඹුර සන්නස යනාදී සෙල්ලිපි තුළින් පැහැදිලි වේ. හයවැනි පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ ඉදිකළ රජමහා විහාරයට හත්වැනි බුවනෙකබාහු රජ දවස සිට රාජ්‍ය අනුග්‍රහය නොලැබෙන්නට ඇත. සියවස් ගණනාවක් තිස්සේ රජතුමා බෞද්ධයෙකු ලෙස පෙනී සිටි සම්ප්‍රදාය උල්ලංඝණය කිරීම ආරම්භ කරන ලද්දේ හත්වන බුවනෙකබාහු රජු විසිනි. ‘මතු බුද්ධ ශාසනයට අනාදරවල් එරජ නිසා පැමුණුණයි දැනගත යුතුයි’ යනුවෙන් *රාජාවලියේ* මේ රජු ගැන සඳහන් වේ[69]. පෘතුගීසීහු තම අරමුණ වූ කතෝලික ධර්මය මෙරට ප්‍රචාරය කිරීමේ කටයුතු මෙකල ආරම්භ කරන ලදී. රජු කතෝලික ආගම වැළඳ නොගත්ත ද කතෝලික ආගම පැතිරවීමට විරුද්ධ නොවීය (අබයසිංහ, 2005: 176).

ධර්මපාල රජවීමෙන් පසුව කෝට්ටේ රජමහා විහාරයේ අවසානය ද ළඟා විය. කෝට්ටේ රජමහා විහාරය හා එහි සියළුම ආදායම් මාර්ග තමන් අනාගතයේදී ඉදිකරන්නට බලාපොරොත්තු වූ කතෝලික පල්ලියක් සඳහා යොදා ගැනීමට ප්‍රැන්සිස්කානු පූජකවරුන්ට හැකි විය. එමෙන් ම ධර්මපාල රජු සන්නසක් මගින් ලංකාවේ සියළු විහාර ඉඩකඩම්වල අයිතිය ප්‍රැන්සිස්කානු පූජකවරුන්ට පවරා දුන්නේ ය.[70] මේ අනුව ධර්මපාල රජතුමා හැර කෝට්ටේ සියලුම පාලකයන් බුදු දහමේ දියුණුව සඳහා විවිධ කටයුතු සිදුකර තිබේ.

ක්‍රි. ව. 1551 දී බුවනෙකබාහු රජු මියයෑම නිසා ධර්මපාල කුමරුට සිහසුන හිමි වූ අතර පෘතුගීසීන්ට අවනත රජෙකු එමගින් ඇති විය. දොන් ජුවන් ධර්මපාල නමින් ඔහු ක්‍රි. ව. 1557 දී කතෝලික බෞතිස්මය ලබා ගැනීමත් සමඟ කෝට්ටේ පාලකයා කතෝලික ආගමික රජෙකු බවට පත් විය. එමගින් පෘතුගීසීන්ට ස්ථාවර දේශපාලන තත්වයක් ද ලබා ගත හැකි විය[71]. කතෝලික ආගම වැළඳ ගැනීමෙන් අනතුරුව රජු බෞද්ධාගමික විරෝධියෙක් ලෙස බුදු දහම විනාශ කිරීමෙහි බොහෝ පියවර ගත්තේ ය.[72] මේ තත්ත්වය සම්බන්ධයෙන් කල කිරීමට පත් වූ කෝට්ටේ රාජ්‍යයේ සිටි භික්ෂූන් වහන්සේලා කන්ද උඩරටට ද සීතාවක රාජධානියට හා වෙනත් ආරක්ෂිත ස්ථාන ද කරා වැඩම කළහ. බොහෝ සිංහල ප්‍රධානීහු හා මහජනතාව සීතාවක මායාදුන්නේ රජු වටා එක්රොක් වූහ.[73]

66 පරනවිතාන, 1972, 711-713

67 ඉලංගසිංහ, 2005, 230-231

68 *ම. ව.*, 92 පරි. 6 ගාථාව

69 *රාජාවලිය*, 1997, 229

70 ඉලංගසිංහ, 2005, 112-113

71 *රාජාවලිය*, 1997, 230

72 අබයසිංහ, 2005, 189-205; බස්නායක, 2002, 53

73 ඉලංගසිංහ, 2006, 38

මේ තත්ත්වය තුළ කෝට්ටේ පාලකයා කෙරෙහි වැසියාගේ භක්ත්‍යාදරය නැතිව ගිය අතර මිථ්‍යාදෘෂ්ටික රජෙකුට එරෙහිව බෞද්ධ බලවේග නැගී සිටීමත් මහාසංඝයා වහන්සේ සිංහල ප්‍රධානීන් හා ජනතාව මායාදුන්නේ වටා ගොඩනැගීමත් නොවැළැක්විය හැකි තත්ත්වයක් උදා කළේ ය. මෙරට චාරිත්‍ර අනුව සීතාවක රාජධානිය සකස්වීම නිසා කෝට්ටේ හා සීතාවක අතර පැවැති දිගු කාලීන අරගලයේදී භික්ෂූන් වහන්සේලා හා රටවැසියාගේ සහයෝගය සීතාවක පාලකයාට හිමි විය. මායාදුන්නේ තම පුත් රාජසිංහ කුමරු හා එක්ව සිදුකළ පහරදීම් හේතුවෙන් ක්‍රි. ව. 1565 දී ධර්මපාල කුමාරයා ද කැටුව පෘතුගීසිහු කොළඹ කොටුවට පැන ගිය හ[74]. මූලාශ්‍රය සඳහන් කරන්නේ ධර්මපාල කුමාරයා පෘතුගීසි රූකඩයක් බවට පත්ව මාසිකව වැටුප් ලබන පෘතුගීසි රජුගේ සේවකයකු බවට පත්ව සිට ක්‍රි. ව. 1597 මැයි 27 මිය ගිය බවයි. රජුගේ මරණයත් සමඟ කෝට්ටේ රාජ්‍යයේ නීත්‍යානුකූල උරුමය පෘතුගීසීන්ට පැවැරුණි[75].

පොළොන්නරු අවධිය වන විට රාජත්වය සම්බන්ධව සම්මතයක් වූයේ 'දළදා වහන්සේ හිමි තැනැත්තාට රජකම හිමිය' යන සංකල්පය ද ඇති වෙමින් නීත්‍යානුකූලව දළදාව රාජත්වයේ සංකේතය බවට පත් ව තිබීමයි[76]. දළදා වහන්සේගේ දේශපාලන වැදගත්කම මෙයින් පසු සැම යුගයකදී ම කැපී පෙනෙන ලක්ෂණයක් විය. දළදාවේ හිමිකම ලබා ගනිමින් රාජත්වයට නීත්‍යානුකූල බව ලබා ගැනීමට හැම විටම පාලකයන් උත්සාහ දරා ඇති බව පෙනේ. දඹදෙණි යුගය මේ සම්බන්ධතාවේ සුවිශේෂී කාලවකවානුවකි[77].

කෝට්ටේ යුගයේදී ද දළදාවට දේශපාලන අතින් සුවිශේෂී ස්ථානයක් හිමි විය. හයවැනි පරාක්‍රමබාහු රජතුමා දළදාව ආරක්ෂා කර ගැනීමෙහි ලා කටයුතු කළේ ය. මොහු රයිගම සිට කෝට්ටේට පැමිණෙන විට දළදාව ද රැගෙන පැමිණියේ ය[78]. මේ අනුව මොහු රයිගම සිටියදීම දළදාව හිමි කරගෙන සිටින්නට ඇත. ගම්පොල රාජධානියේ අවසාන භාගයේදී දළදාව පිළිබඳව නිශ්චිත තොරතුරු හමු නොවේ. එම අවධියේ පාලකයකුව සිටි වීර අලකේශ්වර සම්බන්ධව චීන මූලාශ්‍රය දක්වන ආකාරයට දළදා මැඳුර රජමාළිගය අසලම පිහිටා තිබුණි[79]. අද්මිරාල් චෙං-හෝ විසින් දන්ත ධාතුව චීනයට රැගෙන ගිය බව චීන මූලාශ්‍රය සඳහන් කරතත් එය පිළිගත නොහැකි බවට හේරත්[80] මහතා දක්වන අදහස පිළිගත හැකි ය. එම අවධියේ චීන අධිරාජ්‍යයෙන් ද[81] ආර්යචක්‍රවර්තිගෙන් ද ඇති වූ බලපෑම් නිසා දළදාව ගම්පොල හෝ ඒ ආසන්නයේ ආරක්ෂිතව තබා ගන්නට ඇතැයි අනුමාන කිරීම සාධාරණය. මූලාශ්‍රයවල සඳහන් නොවූව ද, මෙතෙක් යම් ස්ථානයක සඟවා තිබූ දළදා වහන්සේ රජුට ලබා දීමට වීදාගම ස්ථවිරයන් ප්‍රමුඛ මහ තෙරුන් වහන්සේ කටයුතු කරන්නට ඇතැයි ඉලංගසිංහ මහතා අනුමාන කරයි[82]. හයවැනි පරාක්‍රමබාහු කෝට්ටේ මහල් තුනකින් යුක්ත දළදා මන්දිරයක් ඉදිකර එහි දළදා වහන්සේ සඳහා මහත්

74 අබයසිංහ, 2005, 04

75 අබයසිංහ, 2005, 19

76 *ම. ව.,* 68 පරි. 266, 72 පරි., 88; රාහුල හිමි, 77; Herath, 1994, 59-66, 95-101

77 ලියනගමගේ, 1989, 143-145,161; Herath, 1994, 101-109

78 Pieries: 1992, 16

79 Herath, 1994, 77

80 Herath, 1994, 81

81 Herath, 1994, 77

82 ඉලංගසිංහ, 2005, 259

වූ මණ්ඩපයක් කරවා, මැණික් එබ්බ වූ රන් කරඬු සාදා දළදා වහන්සේ එහි තැන්පත් කර පුද පූජා පැවැත්වීමට පියවර ගත්තේ ය[83]. හයවන බුවනෙකබාහු දළදා වහන්සේ සඳහා කරඬුවක් ද කර වූ බව සඳහන් වේ[84]. සන්දේශ කතුවරු හැම දෙනාම දළදා මැඳුර වන්දනා කළ යුතු ප්‍රධාන ස්ථානයක් ලෙස පණිවිඩය රැගෙන යන දූතයන්ට දන්වයි[85]. සන්දේශ කාව්‍ය කතුවරුන් තුළ දළදා වහන්සේ පිළිබඳ පැවති භක්ත්‍යාදරය එයින් පිළිබිඹු වේ. සමාජය තුළ දළදා වහන්සේ පිළිබඳව මුල්බැසගෙන තුබූ ආකල්ප ද එමගින් පෙන්නුම් කෙරේ. වීදාගම හිමියන් දළදා වහන්සේ පිළිබඳ දක්වන්නේ 'බුදුන් වහන්සේගේ පින්කඳ එකට පිඬු වී ලෝකයාට පෙනෙන්නාක් මෙන් රන්රුවන් රශ්මිය විහිදුවමින් සියළු දිශාවන් ඒකාලෝක කොට සත්වයන්ගේ නෙත් සිත් සතුටු කරවමින් සදාකල්හිම බබලන්නා වූ දළදා මන්දිරයට පිවිස වැඳ පූජා පවත්වා...' යනුවෙනි[86]. දළදා වහන්සේ පිළිබඳ ලාංකික අනන්‍යතාව විදේශයන්හි පවා ප්‍රචලිතව පැවතිණි. හයවැනි පරාක්‍රමබාහු රජ දවස බුරුම පාලකයා වූ නරපති රජු රන් හා මුතු දළදා වහන්සේ පිදීම පිණිස එවී ය. එමෙන් ම ඒ රජුගේ අනුප්‍රාප්තිකයා වූ තිහපුර රජු තම බිසවගේ කෙස්වලින් පිස්නාවක් තනා එහි මිටේ මැණික් ඔබ්බවා දළදා මැඳුර පිරිසිදු කිරීමට එවී ය[87]. මෙය දළදා කරඬුවේ ඇතුල් ගැබ පිරිසිදු කිරීමට යොදා ගත්තා විය හැකි ය. හත්වැනි බුවනෙකබාහු රාජ්‍ය කාලය දක්වාම දළදා වහන්සේ කෝට්ටේ දළදා මැඳුරේම වැඩ සේක. ධර්මපාල රජුගේ කටයුතු හමුවෙහි රාජත්වයේ සංකේතය වූ දළදා වහන්සේ ආරක්ෂා කරගැනීම සඳහා ඒ වන විට කෝට්ටේ දළදා මාළිගාවේ දියවඩන නිළමේව සිටි හිරිපිටියේ රාළ ශ්‍රී දන්තධාතූන් වහන්සේ ආරක්ෂිතව රැගෙන ගොස් සීතාවක මායාදුන්නේ රජුට භාර කිරීමට කටයුතු කළේ ය. දළදාව ලද මායාදුන්නේ රජතුමා දෙල්ගමුවේ මාළිගයක් තනවා දළදා වහන්සේ එහි තැන්පත් කර ආරක්ෂා කිරීමට පියවර ගත්තේ ය[88]. මායාදුන්නේ රජුගේ දේශපාලන බලය වර්ධනය වීමට දළදා වහන්සේ ලැබීම බෙහෙවින් ම හේතු විය. ලංකා රාජ්‍යය නීත්‍යානුකූල උරුමයෙන් ලද බව ප්‍රකාශ කිරීමට දෝ ඔහු 'ත්‍රිසිංලාධීශ්වර' යන විරුදය භාවිතා කිරීමට මෙතැන් සිට පටන් ගත්තේ ය[89]. රාජ්‍ය හිමිකමේ සංකේතය වූ දළදාව හිමිවීම නිසා අත් වූ දේශපාලන ශක්තිය පදනම් කරගනිමින් මායාදුන්නේ රජු යටතේ ජාතික නිදහස් සටන් ව්‍යාපාරයක් සංවිධානය විය. එහි ප්‍රතිඵලය වූයේ පළමුවැනි රාජසිංහ රජු යටතේ මුල්ලේරියා වෙලේදී ඇති වූ සටනින් පෘතුගීසීන්ට දරුණුතම පරාජයක් අත් වීමයි[90]. සමාජ හා දේශපාලනික වශයෙන් දළදාව වැදගත් වන ආකාරය හයවැනි බුවනෙකබාහු රජුගේ දැදිගම ලිපියෙන් ද ගම්‍ය වේ. රජුට විරුද්ධව කැරලි ගැසූ සතර කෝරලවාසීන්ට සමාව දීම සඳහා වූ ප්‍රකාශනයක් බඳු වූ මේ සෙල්ලිපියෙහි 'දළදා පාත්‍රා ධාතූන් වහන්සේගේ ආඥාය' යනුවෙන් සඳහන් වේ[91].

83 *සද්ධර්මරත්නාකරය*, 1955ල 318-319ත ම. ව., 92 පරි. 18-22 ගාථා

84 Silva, CR, 1995ල 33

85 *පරෙවි සන්දේශය*, 42-43; *කෝකිල සන්දේශය*, 135; *සැළලිහිණි සන්දේශය*, 17; *ගිරා සන්දේශය,* 50-55, 133

86 *හංස ස.*, 47 කවිය

87 Herath, 1994, 82-83

88 ඉලංගසිංහ, 2005, 42

89 ඉලංගසිංහ, 2005, 261

90 ඉලංගසිංහ, 2006, 40-41

91 *E. Z.*, vol. iii, 279-281

රාජත්වය හා බැඳී තිබූ අනෙක් කාර්යය වූයේ රජු හා භික්ෂුව අතර පැවැති අන්‍යෝන්‍ය බැඳීමයි. මෙය ක්‍රි. පූ. 3 සියවසේ දේවානම්පිය තිස්ස රජුගේ පටන් ආරම්භ වූ සබැඳියාවකි. හයවැනි පරාක්‍රමබාහු රජු ළදරු අවධියේ පටන් ආරක්ෂා කර සිහසුනේ තැබීමේ භාරදූර කාර්යය සිදු කරන ලද්දේ වීදාගම මහ තෙරුන්ගේ නායකත්වයෙනි[92]. කෙසේ වුව ද, ජයබාහු මරා සපුමල් කුමරුට සිහසුන ලබා ගැනීමට සංඝරාජ රාහුල හිමියන්ගේ දායකත්වය නොලැබිණ. සමාජයේ ප්‍රධානත්වය ගෙන සිටි භික්ෂූන් වහන්සේලා මේ රජු දවස දෙපිළකට බෙදී සිටි බවට ද ඉඟි ලැබේ[93]. මේ අවධියේ විසූ පාණ්ඩිත්‍යයෙන් හෙබි සුප්‍රකට භික්ෂූන් වහන්සේලාගේ අනුග්‍රහය රාජ්‍යයේ පැවැත්මට බෙහෙවින් ම උපකාරී වන්නට ඇත. හත්වැනි බුවනෙකබාහු රජතුමාගේ දියණිය අටවන වීරපරාක්‍රමබාහු රජුගේ පුත් වූ තනියවල්ලභ කුමරුගේ දියණියගේ පුතා වූ වීදියබණ්ඩාරට විවාහ කරදීම සඳහා භික්ෂූන් වහන්සේලා මැදිහත් විය. හත්වන බුවනෙකබාහු හා ඔහුගේ සොහොයුරු සීතාවක මායාදුන්නේ අතර ඇති වූ ගැටුමකදී මායාදුන්නේ පරාජය වූ විට දෙදෙනා සමගි කිරීමට ක්‍රි. ව. 1537දී භික්ෂූන් වහන්සේලා මැදිහත් විය[94]. පූර්ව යුගවලදී මෙන් ම කෝට්ටේ යුගයේදී ද භික්ෂූන් වහන්සේලා රාජ්‍යයේ පැවැත්ම සඳහා සිය යුතුකම් ඉටු කර තිබේ. හත්වන බුවනෙකබාහු රජු සිය අවසන් කාලයේදී ආරක්ෂාව පතා පෘතුගීසීන් සමඟ සම්බන්ධවීම නිසා ඔහුට ද වීදියබණ්ඩාරගේ පුතා වූ ධර්මපාල රජුට ද භික්ෂූන් වහන්සේලාගේ අනුග්‍රහය නොලැබිණ. එහෙත් සීතාවක මායාදුන්නේ රජුට භික්ෂූන්ගේ සහයෝගය හිමි විය. එකල විසූ බුද්ධවංස නම් මහ තෙරුන්වහන්සේ කෙනෙකු රජු වටා ජනතාව ඒකරාශී කිරීමට කටයුතු කළ බව සඳහන් වේ[95].

නවවන ධර්ම පරාක්‍රමබාහු රජ දවස පළමුවෙන් ම පෘතුගීසිහු ලංකාවට ගොඩ බැස්ස හ[96]. එහිදී රජු හා පෘතුගීසි තානාපති ලෙස පැමිණි පයෝ ද සූසා අතර ඇතිවූ ගිවිසුමට අනුව මෙරට වෙළඳාම සඳහා ඔවුන්ට අවකාශය ලැබුණි. හය වන විජයබාහු රජ දවස මොවුහු ආයුධ ශක්තිය තුළින් කොළඹ බලකොටුවක් ඉදි කරගැනීමට සමත් වූහ[97]. ඔවුහු මෙලෙස වෙළඳාම කෙරෙහි මුලදී අවධානය යොමු කළ අතර පසුව මෙරට දේශපාලන ගැටුම්වලින් ප්‍රයෝජන ගනිමින් පාලනාධිපත්‍යය අල්ලා ගැනීමට කටයුතු කළ හ. ක්‍රි. ව. 1521 දී විජයබා කොල්ලය හේතුවෙන් ඇති වූ පසුබිම පෘතුගීසීන්ට ඒ සඳහා අවස්ථාව උදා කළේය. එහිදී කෝට්ටේ පාලකයා වූ බුවනෙකබාහු හා ඇති වූ සහෝදර අරගල හේතුවෙන් බුවනෙකබාහුට පෘතුගීසි සහයෝගය ලබාගැනීමට සිදු විය[98]. ඒ වෙනුවෙන් බුවනෙකබාහු රජතුමාට ඔවුන්ගේ විවිධ බලපෑම්වලට මුහුණ පෑමට සිදු විය. පෘතුගීසි හමුදාවේ ආරක්ෂාව පැතීමට සිදුවීම නිසා පෘතුගීසි හමුදාවට වැටුප් ගෙවීමටත් විශාල වශයෙන් ඔවුනට කප්පම් ගෙවීමටත් කෝට්ටේ රාජ්‍යයේ අපනයන ද්‍රව්‍ය මිලදී ගැනීමේ ඒකාධිකාරිය ලබාදීමටත් අඩු මිලට භාණ්ඩ සැපයීමටත් රජුට සිදු විය. ඒ වගේම කතෝලික ආගමේ බලපෑම ද සිදු විය. මෙරට රාජ්‍යත්වයට කතෝලික ආගමෙන් ලද බලපෑම වූයේ ධර්මපාල කුමාරයාව ක්‍රිස්තියානි කුමාරයෙකු වශයෙන් හදා ගැනීම හා

92 රාජාවලිය, 1997, 217
93 බස්නායක, 2002, 143-154
94 Silva CR de, 1995, 34
95 ඉලංගසිංහ, 2006, 40-41
96 *රාජාවලිය*, 1997: 223
97 පෙරේරා, 1963, 19-21
98 *රාජාවලිය*, 1997, 226

හත්වන බුවනෙකබාහු රජතුමා ඔවුනට අවශ්‍ය පරිදි කටයුතු කරන්නෙකු බවට පත්කර ගැනීම ය. ධර්මපාල කුමාරයාගේ පිළිරුවක් නෙලා පෘතුගාලයට යවා ඔටුනු පැළඳවීමට ඔවුන් කටයුතු කළේ ය. හත්වන බුවනෙකබාහු රජුගේ අවසාන කාලයේදී පෘතුගීසීන්ගේ කුමන්ත්‍රණද ක්‍රමයෙන් වැඩි විය. ක්‍රි. ව. 1551 දී රජු අවාසනාවන්ත ලෙස මිය ගිය අතර ධර්මපාල කුමාරයාට සිහසුන හිමි විය. එය පෘතුගීසීන් ලත් ජයග්‍රහණයකි. ක්‍රි. ව. 1557 දී ධර්මපාල කුමරු බෞතිස්ම කිරීමත් සමඟ පෘතුගීසීන්ගේ අභිප්‍රාය සාර්ථක විය. ක්‍රි. ව. 1597 දී ධර්මපාල රජතුමා මිය යාමෙන් අනතුරුව කෝට්ටේ රාජ්‍යය නීත්‍යානුකූලව පෘතුගාලයේ රජුට හිමි විය. මෙලෙස මෙරට රාජත්වයට පෘතුගීසීන් කළ බලපෑම් මගින් ලාංකික උරුමය අවාසනාවන්ත ලෙස අහිමි වී කෝට්ටේ යුගයේ පරිහානියට ගමන් කිරීම නොවැලැක්විය හැකි තත්ත්වයක් බවට පත්විය.

කෝට්ටේ රජවාසල තුළ ද්‍රවිඩ සම්බන්ධතාවලට මුල පුරා ඇත්තේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් ම ය එයට අනුව හයවන පරාක්‍රමබාහු රජතුමා දකුණු ඉන්දියානුවකු වූ පනිකල් රජවාසල සේවයට බඳවා ගෙන ඇත. එමෙන්ම පනිකල්ගේ දරුවන් වූ සපුමල් හා අම්බුලුගල යන කුමාරවරු රජු විසින් පුත් තනතුරේ ඇතිදැඩි කළේය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ හයවැනි පරාක්‍රමබාහු රජුගේ මුනුපුරකු වූ ජයබාහු රජු මරණයට පත් කර සපුමල් කුමරු හයවන බුවනෙකබාහු නමින් සිහසුනට ලබා ගැනීමය. එතැන් සිට කෝට්ටේ සිහසුනට පත් වූවන් මගින් මෙරට රාජත්වයට ද්‍රවිඩ බලපෑම් ඇති වූ බව පැහැදිලිය.

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය මත පදනම්ව සිදු කරන ලද ඉහත විග්‍රහය අනුව කෝට්ටේ රාජධානි අවධියේ මෙරට රාජ්‍ය පාලනය රජුගේ මූලිකත්වයෙන්, විශාල නිලධාරී තන්ත්‍රයක සහයෝගයෙන් ක්‍රියාත්මක වූ යාන්ත්‍රණයක් විය. එම යාන්ත්‍රණය ශක්තිමත් කිරීමෙහිලා පුරෝගාමී පාලකයා වූයේ හයවන පරාක්‍රමබාහු රජු ය. ඒ රජු විසින් ගොඩනංවන ලද පදනම මත පාලන රටාව ක්‍රියාත්මක වී ඇත. එහි ශක්තිමත් බව කොතෙක් ද යත් කෝට්ටේ රාජධානිය ක්‍රි. ව. 1597 දී අත්කරගත් පෘතුගීසීන් තමනට උරුම වූ ඒ සිංහල පාලන රටාවේ මූලිකාංග එලෙසම පවත්වාගෙන ගියහ.

චිරාත්කාලයක් තිස්සේ සිංහල රාජ්‍යයේ පැවැත්ම රැඳුනේ රජු, ප්‍රභූ පංතිය, මහාසංඝයා වහන්සේ හා පොදු ජනතාව යන සාධක මත ය. මේ සාමූහිකත්වය ඒකරාශි කළේ පැරණි සම්මත චාරිත්‍රවලට පටහැනි නොවන ආකාරයෙනි. රාජත්වය රටේ උසස්ම තනතුරයි. රජු හා ජනතාව අතර බැඳීම් පැවැතියේ සම්මත චාරිත්‍ර අනුවය. එම සම්මත චාරිත්‍ර උල්ලංඝණය කිරීම තුළින් රාජ්‍යයේ පැවැත්ම එම පාලකයාට රඳවා ගැනීමට නොහැකි බව කෝට්ටේ රාජ්‍යයෙන් ම මෙන් ම ඉතිහාසයේ තවත් බොහෝ සිදුවීම් තුළින් ප්‍රකට වේ.

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


### ප්‍රාථමික මූලාශ්‍රය

**සිංහල බෝධිවංශය**, 1998, වී. ඩී. එස්. ගුණවර්ධන (සංස්.), සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ.

**නිකාය සංග්‍රහය**, 1934, පී. කේ. ඩබ්. සිරිවර්ධන (සංස්.), පී. කේ. ඩබ්. සිරිවර්ධන පොත් ප්‍රකාශකයෝ කොළඹ.

**අලකේශ්වර යුද්ධය**, 1965, ඒ. වී. සූරවීර (සංස්.), රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

**සද්ධර්මරත්නාකරය**, 1955, ධර්ම කීර්ති ශ්‍රී සුගුණසාර (සංස්.), කලපලුවාවේ රත්නාකාර පොත් වෙළෙඳ ශාලාව, කොළඹ.

**කෝකිල සන්දේශය**, 1962, එම්. එච්. එෆ්. ජයසූරිය (සංස්.), මහාබෝධි මුද්‍රණාලය, කොළඹ.

**හංස සන්දේශය**, 1979, ජී. එස්. බී. සේනානායක (සංස්.), ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ.

**හංස සන්දේශය**, 1979, කේ. ඩී. පී. වික්‍රමසිංහ (සංස්.), සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**පැරකුම්බා සිරිත,** 1954, ශ්‍රී චාල්ස් ද සිල්වා (සංස්.), සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**ගිරා සංදේශය,** 2001, වී. ඩී. එස්. ගුණවර්ධන (සංස්.), සමයවර්ධන පොත් සමාගම, කොළඹ.

**සැළලිහිණි සන්දේශය**, 1966, ජී. එස්. බී. සේනානායක (සංස්.), ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ.

**පරෙවි සන්දේශය**, 1997, ඒ. ඒ. අබයසිංහ (සංස්.), අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, මහර.

**සැවුල් සන්දේශය,** 1968, ධම්මසිරි උඩුපිල සහ ගමගේ සිරිසේන (සංස්.), විජිත ප්‍රකාශකයෝ, දෙල්ගොඩ.

**කාව්‍ය ශේඛර මහා කාව්‍යය**, 1966, හැඩිපන්නල පඤ්ඤාලෝක (සංස්.), විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

**මහාවංසය 1,2 කාණ්ඩ**, සිංහල පරිවර්තනය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

**රාජාවලිය,** 1997, ඒ. වී. සුරවීර (සංස්.), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

**ගුත්තිල කාව්‍ය වර්ණනා**, 1962, එම්. එච්. එෆ්. ජයසූරිය (සංස්.), ලංකා සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ.

**දඹදෙණි අස්න,** 1960, කිරිඇල්ලේ ඥාණවිමල ථෙර (සංස්.), සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*Epigraphia Zeylanica (E.Z.),* III, IV, V

### නූතන කෘති

අබයරත්න, ඒ. එච්. එම්. එච්., 2009, **ගම්පොල යුගය**, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

අභයසිංහ, ටිකිරි, 2005, **පරංගි කෝට්ටේ** (1594-1612), ආර්. එස්. ප්‍රින්ටෙක් ප්‍රයිවෙට් ලිමිටඩ්, මල්වාන.

ආරියපාල, එම්. බී. 1996, **මධ්‍යකාලීන ලංකා සමාජය**, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

ඉලංගසිංහ, මංගල, 2005, **මධ්‍යකාලීන ලංකාවේ ආගම**, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

ඉලංගසිංහ, මංගල 2006, **ශ්‍රී ලංකාවේ නිදහස් සටන් ව්‍යාපාර හා වීරයෝ**, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

ඉලංගසිංහ, මංගල 2006, ,*කෝට්ටේ යුගයේ ආරාමික අධ්‍යාපනය*, **කෝට්ටේ සංස්කෘතික උරුමය 1**, දිමියාවේ අමරවංස හිමි හා ඇලිකේවෙල සීලානන්ද හිමි (සංස්.), ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය.

එල්ලාවල, එච්., **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

කුලසේකර, කේ. එම්. පී., 2008, ,**ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශවල කුල ක්‍රමය**,, ***මානවවංශ විද්‍යාව***, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

ගුණවර්ධන, ආර්. ඒ., 1993, **සිවුර හා නගුල**, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ.

පරනවිතාන, සෙනරත් 1964, *පැරණි යුගයේ සභ්‍යත්වය: අර්ථ, දේශපාලන හා සමාජ තත්ව,* **ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය**, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

පරනවිතාන, සෙනරත්, 1972, *ගංපළ සහ රයිගම 1505 දක්වා කෝට්ටේ රාජ්‍යය*, **ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය**, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, 2004, **කෑගලු දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව**, කොළඹ.

පෙරේරා, එස්. එල්., 1965, **අනුරාධපුර යුගය**, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පෙරේරා, එස්. ජී. 1963, **ලංකා ඉතිහාසය පෘතුගීසි යුගය,** සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ.

පේක්මන් එස්. ඒ. සහ මෙන්ඩිස් ජී. සී., 1969, **අපේ උරුමය 2: ලංකා හා ලෝක ඉතිහාසය 1500-1796**, සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම, කොළඹ.

බස්නායක, එච්. ටී. 2002, **ශ්‍රී ලංකාවේ ශිෂ්ඨාචාරය 2**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

බෙල්, එච්. සී. පී., 2004, ***කෑගලු වාර්තාව***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ.

ජයතිලක, ඩී. බී., 1954, **කතිකාවත් සඟරා**, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

ජයතිලක, ඩී. බී., 1956, **සිංහල සාහිත්‍ය ලිපි**, සමන් මුද්‍රණාලය, කොළඹ.

රණවැල්ල, සිරිමල්, (2000), ,*අනුරාධපුර රාජ්‍යයේ දේශපාලන හා පරිපාලන සංවිධාන*,, **උරුමයක ආවර්ජනය, I භාගය**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ.

රාහුල හිමි, වල්පොල, 1999, **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**, සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ලියනගමගේ, ඒ., 1989, **මධ්‍යකාලීන ලංකා ඉතිහාසය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

ලියනගමගේ, ඒ., 2010, **සමාජය, රාජ්‍යය හා ආගම**, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ.

ද සිල්වා, එම්. යූ. 1988, **ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය**, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, මහර.

සුධර්මාවතී, ජේ. ඇම්., 2004, ,*කෝට්ටේ යුගයේ ශාසනික පසුබිම*, **කෝට්ටේ සංස්කෘතික උරුමය 1**, දිමියාවේ අමරවංස හිමි හා ඇලිකේවෙල සීලානන්ද හිමි (සංස්.), ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය.

සුමනජෝති හිමි, දෙගම්මැද, 1964, **දඹදෙණි යුගය: ප්‍රථම භාගය**, විද්‍යාදීප මුද්‍රණාලය, කළුතර.

සුරවීර, ඒ. වී., 1985, **සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය**, සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

හෙට්ටිආරච්චි, එස්. බී., 2008, *සංක්ෂිප්ත ලංකා* ඉතිහාසය, සමන් ප්‍රකාශකයෝ, නුගේගොඩ.

සෝමරත්න, ජී. වී. පී., 1982, **ජයවර්ධන කෝට්ටේ 1380-1597**, අත්පිටපත.

හේරත්, ධර්මරත්න 2004, ,*ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටය පිහිටුවීම හා දහසය වන සියවසේ මුල් දශකය දක්වා ලංකා ඉතිහාසය පිළිබඳ විමර්ශනයක්*,, **කෝට්ටේ සංස්කෘතික උරුමය 1**, දිමියාවේ අමරවංස හිමි හා ඇලිකේවෙල සීලානන්ද හිමි (සංස්.), ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලය.

හේවාවසම්, අභය, 2008, ලංකාව - පෘතුගීසි යුගය, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

Dewaraja, Lorna (1972). *The Kandyan Kingdom of Ceylon – 1707-1760*. Colombo: Lake House Investment Ltd,

Herath, Dharmaratna (1994). *The Tooth Relic and the Crown*, Colombo: Gunaratne Offset Ltd.

De Silva, C.R. (1995). Sri Lanka in the Early 16th Century: Polititical Conditions. In K.M.de Silva (ed.) *Histotry of Sri Lanka*, Peradeniya: University of Peradeniya.

Pieris, P. E. (1992), *Ceylon: The Portuguess Era*, Volume one. Tisara Prakasakayo Ltd.

Somaratne, G. P. V. (1975). *Political History of the Kingdom of Kotte*. Nugegoda: Deepnee Printers.

*Journal of the Ceylon Branch of the Royal Asiatic Society,* vol. xx, No. 60 (1908).

*Journal of the Ceylon Branch of the Royal Asiatic Society,* vol. v, No. 16, (1970 -1971) pp 35-41

*Journal of the Ceylon Branch of the Royal Asiatic Society,* vol. x, No. 34 (1970 -1971)